www.defence.lk වෙබ් අඩවියෙහි ඇති වැඩිදුර තොරතුරු.

**තනතුරු පුරප්පාඩු**

**ආරක්ෂක අමාත්‍යාංශය**

**ආරක්ෂක අමාත්‍යාංශය යටතේ පවත්නා රසායනික අවි සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ ජාතික අධිකාරියේ ජ්‍යෙෂ්ඨ කළමනාකාර ගණයට අයත් අධ්‍යක්ෂ තනතුර (ස්ථිර) සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම.**

ආරක්ෂක අමාත්‍යාංශය යටතේ පවත්නා රසායනික අවි සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ ජාතික අධිකාරියේ ජ්‍යෙෂ්ඨ කළමනාකාර ගණයට අයත් අධ්‍යක්ෂ තනතුර සඳහා ස්ථිර පදනම මත පුරප්පාඩු 01ක් පිරවීම සඳහා නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සපුරාලන ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. බඳවා ගැනීමේ ක්‍රමය:**

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතරින්, ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් විසින් පත්කරනු ලබන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්නු ලබන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහලම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයා බඳවා ගනු ලැබේ. එහි දී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද (අංක 06 යටතේ සඳහන්) ලකුණු ලබාදීමේ පටිපාටියට අනුකූලව යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

පත්වීම ක්‍රියාත්මක වන දිනය විෂයභාර අමාත්‍යාංශයේ ගරු අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලැබේ.

**02. අවශ්‍ය සුදුසුකම් :**

i. අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද :

- බාහිර අයදුම්කරුවන්

රසායන විද්‍යාව විෂයයක් සහිත විද්‍යාවේදී හෝ රසායන විද්‍යාව විශේෂවේදී හෝ ඉංජිනේරු (රසායනික) යන විෂය ක්ෂේත්‍රයකින් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් සමඟ අදාල ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් ලබා තිබීම

සහ

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකරණ මට්ටමේ " තනතුරක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර පහළොවක (15) ක පළපුරුද්දක් ලබා තිබීම

- අභ්‍යන්තර අයදුම්කරුවන්

ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම

හෝ

කළමනාකාර සේවා (MM) සේවා ගණයෙහි 1 වන ශ්‍රේණියෙ හි තනතුරක අවම වශයෙන් වසර පහ (5)ක අදාල විෂය ක්ෂේත්‍රයෙහි සතුටදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිම.

ii. කායික සුදුසුකම්:

තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන් ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

iii. වෙනත් සුදුසුකම් :

( අ ) ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

( ආ) විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

( ඇ ) අයදුම්පත් කැඳවන අවසන් දිනට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

**03. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :**

i. මෙම තනතුර ස්ථිරය, සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල් සඳහා හිමිකම් සහිත වේ.

ii. බාහිර අයදුම්කරුවන් අතුරින් තනතුරට පත් කරනු ලබන නිලධාරියකු වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලබන අතර, ඔහු / ඇය පරිවාස කාලය තුල සිය රාජකාරී වැඩ හා හැසිරීම සතුටුදායක අන්දමින් පවත්වා ගෙන ගොස් තිබේ නම් පරිවාස කාලය අවසානයේ දී සේවයේ තනතුරේ ස්ථිර කරනු ලැබේ. සුදුසුකම් ලැබීමේ සේවා ගණයේ තනතුරක ස්ථිර කර සිටින අභ්‍යන්තර අයදුම්කරුවන් වශයෙන් බඳවාගනු ලබන තැනැත්තන් සේවයට පත් කිරීමේ දී වැඩ බැලීමේ පරීක්ෂණ කාල සීමාවක් නියම කරනු ලැබිය හැකිය.

iii. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලටද මෙම පත්වීම යටත් වේ.

**04. වයස් සීමාව :**

ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනට වයස අවු : 35ට නොඅඩු හා අවු : 55ට නොවැඩි විය යුතුය.
අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

**05. වැටුප් පරිමාණය :**

HM 1-1 රු.140,640 -15 x 4,100 – 202,140

(ඔබට වැටුප් ගෙවනු ලබන්නේ කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 හි II උපලේඛණය පරිදි වේ.)

**06.** **යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කරගනු ලැබේ.**

| | ලකුණු ප්‍රදානය කරනු ලබන ශීර්ෂ | ලකුණු බෙදී යන ආකාරය | උපරිම ලකුණු |
|---|---|---|---|
| 01 | **අතිරේක අධ්‍යාපන සුදුසුකම්/ අතිරේක වෘත්තීය සුදුසුකම්**<br><br>**(මූලික සුදුසුකම් හා මූලික සුදුසුකම් සඳහා හේතු වන ලද සුදුසුකම් හැර)**<br><br>ක්ෂේත්‍රයට අදාළව ලබා ගන්නා ලද ආචාර්ය උපාධිය | ලකුණු 30 | 30 |
| | **ලකුණු ප්‍රදානය කරනු ලබන ශීර්ෂ** | **ලකුණු බෙදී යන ආකාරය** | **උපරිම ලකුණු** |
| 02 | **අතිරේක පළපුරුද්ද**<br><br>ක්ෂේත්‍රයට අදාළව ලබා ගත් පළපුරුද්ද සඳහා (මූලික සුදුසුකම් සඳහා සලකා බලනු ලබන වසර 15 ක පළපුරුද්දට අමතරව සලකා බලනු ලැබේ)<br><br>(උපරිම ලකුණු 30ක් පමණක් ලබා දේ.) | වසරකට ලකුණු 05 බැගින් | 30 |
| | **ලකුණු ප්‍රදානය කරනු ලබන ශීර්ෂ** | **ලකුණු බෙදී යන ආකාරය** | **උපරිම ලකුණු** |
| 03 | **පරිගණක හැකියාව**<br><br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගන්නා විශ්වවිද්‍යාලයක තොරතුරු තාක්ෂණ ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඇති උපාධියක් සඳහා<br><br>රජයේ පිළිගත් ආයතනයක අවුරුදු 01කට නොඅඩු හෝ පැය 1500 ක තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා<br><br>රජයේ පිළිගත් ආයතනයක තොරතුරු තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා<br>- මාස 06/ පැය 720<br>- මාස 03/ පැය 360<br><br>(ඉහලම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දේ) | ලකුණු 7.5<br><br>ලකුණු 5<br><br>ලකුණු 3<br><br>ලකුණු 2 | 15 |
| | **භාෂා ප්‍රවීණතාව**<br><br>**ඉංග්‍රීසි භාෂාව**<br><br>ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරන ලද පශ්චාත් උපාධිය/උපාධිය (අදාළ විභාග ප්‍රශ්න පත්‍ර සියල්ල සඳහා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පිළිතුරු සපයා තිබිය යුතුය) | ලකුණු 7.5 | |

| | | | |
|---|---|---|---|
| | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ රජයේ පිළිගත් ආයතනයක ඉංග්‍රීසි භාෂාව පිළිබඳව ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා<br>(වසර 01 කට නොඅඩු හෝ පැය 1500)<br><br>විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක හෝ රජයේ පිළිගත් ආයතනයක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා<br>- මාස 06/ පැය 720<br>- මාස 03/ පැය 360<br><br>(ඉහලම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දේ) | ලකුණු 5<br><br>ලකුණු 3<br><br>ලකුණු 2 | |
| | **ලකුණු ප්‍රදානය කරනු ලබන ශීර්ෂ** | ලකුණු බෙදී යන ආකාරය | **උපරිම ලකුණු** |
| **04** | **සම්මුඛ පරීක්ෂණයේදි දක්වන කුසලතා**<br>➢ නායකත්වය<br>➢ ආකල්ප<br>➢ පෞරුෂත්වය<br>➢ සන්නිවේදනය | | 25 |
| | **මුළු එකතුව** | | **100** |

**සටහන -** යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කරනු ලබන සහතික පත්වල අදාළ කාල සීමාවන් පිළිබඳව සඳහන් නොවන්නේ නම්, එවැනි සහතිකපත්‍ර වලට අදාළ කාලසීමාවන් අදාළ ආයතනය මගින් ලිඛිතව තහවුරු කරවාගෙන ඉදිරිපත් කිරීම අයදුම්කරුගේ වගකීම වේ. එසේ කාල සීමාවක් සඳහන්ව නොමැති සහ කාලසීමාව තහවුරු නොකළ සහතික පත්‍ර ලකුණු ලබාදීම සම්බන්ධයෙන් සලකා බලනු නොලැබේ.

## 07. අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :

යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.
සම්මුඛ පරීක්ෂණයේ දී සියලුම සහතික පත්වල මුල්පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතුය.
සම්මුඛ පරීක්ෂණයේදී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරිම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.

i. වලංගු ජාතික හැඳුනුම්පත
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය

## 08. අයදුම්පත් ඉදිරිපත් කළයුතු ආකාරය

i. සම්පූර්ණ කරන ලද අයදුම්පත් ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය, ආරක්ෂක සේවා අංශය, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ යන ලිපිනය වෙත 2026.07.31 දිනට හෝ එදිනට ප්‍රථම ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු වේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ii. ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘති පත්‍රයක් මෙම නිවේදනය අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර මුල් පිටුව අංක 01 සිට 03 දක්වාත් 02 වන පිටුව අංක 04 සිට 06 දක්වාත් 03 වන පිටුව අංක 07 සිට 08 දක්වාත් වන ආකාරයෙන් පිළියෙළ කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතුය.

iii. අයදුම්පත් බහාලන කවරයේ ඉහල වම් කෙළවරේ “රසායනික අවි සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ ජාතික අධිකාරියේ අධ්‍යක්ෂ තනතුර (ස්ථිර) සඳහා අයදුම් කිරීම“ යනුවෙන් සඳහන් කළ යුතුය.

iv. අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්වයකාරවරයකු/දිවුරුම් කොමසාරිස්වරයකු/නීතිඥවරයකු /ප්‍රසිද්ධ නොතාරිස්වරයකු / ත්‍රිවිධ හමුදාවේ අධිකාරීලත් නිලධාරියකු හෝ රු. 72,280/- ක මූලික මාසික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු විසින් සහතික කළ යුතුය.

v. දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් තම අයදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

vi. මේ සමඟ ඇති ආදර්ශ අයදුම් පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

**09. සාවද්‍ය තොරතුරු සැපයීම :**

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තාවූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියාමාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

**10.** මෙම ගැසට් නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් හෝ ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේය.

**11**. මෙම නිවේදනයේ සඳහන් නොවන කරුණක් සම්බන්ධයෙන් හෝ මෙම බඳවා ගැනීමේ ක්‍රියාමාර්ගය තුළ කිසියම් ගැටළුකාරී තත්ත්වයක් ඇති වුවහොත් ඒ පිළිබඳව පත්වීම් බලධාරියා විසින් ගනු ලබන තීරණය අවසාන තීරණය වේ.

පත්වීම් බලධාරියාගේ නියමය පරිදි,

ලේකම්
ආරක්ෂක අමාත්‍යාංශය,
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය,
ශ්‍රී ජයවර්ධනපුර,
කෝට්ටෙ.
2026 ජුලි මස 10 වන දින